# ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනයට ද්විතීයික අධ්‍යාපනය දායක වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

University of Colombo
Sri Lanka
23 JAN 2015

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණ නිබන්ධය

UCLIB
586086
University of Colombo Library Sri Lanka

2008/M.Phil/08

**නිලමණී අඹුරලගේ**

සාමාන්‍ය ශාස්ත්‍රවේදී (ගෞරව) කැළණිය වි.වි.,
අධ්‍යාපනපති කොළඹ වි.වි. , ප. උ. අධ්‍යා. ඩිප්. කොළඹ වි.වි.,
ලේඛකත්ව හා සන්නිවේදන ප. උ. ඩිප්. ශ්‍රී ජය.පුර. වි.වි.

2015/01/22

# සාරාංශය

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වුයේ ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනය සඳහා ද්විතියික අධ්‍යාපනය දායක වන ආකාරය පිළිබඳ සොයා බැලීමයි. සමාජ හැකියා සංවර්ධනය යන්න පුළුල් විෂය පථයක පැතිරී ඇති සංකල්පයක් සේම සමාජ හැකියා සංවර්ධනය යන්න ද විවිධ හේතු සාධක රැසක බලපෑමෙන් යුතු ව දීර්ඝ කාලයක් පුරා සිදුවන ක්‍රියාදාමයක් වේ. මෙම අධ්‍යයනයේදී සමාජ හැකියා සංකල්පය හඳුනා ගැනීම වයින්ඩ්ලන්ගේ සමාජ ඉගෙනුම් න්‍යාය ද ඇතුලත්ව පසුකාලීනව විවිධ අධ්‍යාපනඥයින්, විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද සමාජ හැකියාවන් ද ඇසුරු කරගෙන සිදුකර ඇත. මේ අනුව ප්‍රධාන සමාජ හැකියා අටක් හඳුනා ගැනීම සිදුවිය. සහානුකම්පාව, සම්බන්ධතා ඇතිකර ගැනීම, බලපෑම් ලැබීම බලපෑම් කිරීම, සන්නිවේදනය, නායකත්වය, කණ්ඩායම් සහයෝගය, ධර්මතා හා ප්‍රතිමාන ගරුක බව, මෙම හැකියා වේ.

අධ්‍යයනයේ හැඳින්වීම යටතේ ප්‍රාථමික සමාජ වල දරුවන්ගේ සමාජ හැකියා සංවර්ධනය ජීවත් වූ සමාජ වටපිටාව ඇසුරෙන් ගැටළුවකින් තොරව සිදුවූ ආකාරයත්, පසුකාලීනව ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනය පාසල වෙත පැවරී ඇති ආකාරයත්, වර්තමානය වන විට ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනය කෙරෙහි පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය ඍජු ලෙසම මැදිහත්වීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන් පිළිබඳව ද පෙන්වා දෙමින් අධ්‍යයනයේ අවශ්‍යතාවය තහවුරු කර ඇත.

පෙර සාහිත්‍යයේ සමාලෝචනය යටතේ ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනය කෙරෙහි බලපානු ලබන විවිධ සාධක පිළිබඳව තොරතුරු හෙළි කිරීම වර්තමානයේ පාසල් වල සමාජ හැකියා සංවර්ධනය වන ආකාරය හා සමාජ හැකියා සංවර්ධනය විය යුතු ආකාරය පිළිබඳව විධිමත් විෂය මාලාව, විෂය සමගාමී ක්‍රියා, සදාචාර විෂය මාලාව යටතේ තොරතුරු හෙළිකර ඇත. වැඩිදුරටත් ශිෂ්‍ය සමාජ හැකියා සංවර්ධනය කෙරෙහි විවිධ රටවල් ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව ද තොරතුරු දක්වා ඇත.

අධ්‍යයන ක්‍රම පිළිවෙත යටතේ අධ්‍යයන සැලැස්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. අධ්‍යයනය සඳහා විස්තරාත්මක අධ්‍යයන ක්‍රම වේදය තෝරා ගනිමින් ඒ යටතේ මූලිකවම සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයද අවශ්‍ය පරිදි ගුණාත්මක පර්යේෂණ ක්‍රමය ද භාවිතයට ගෙන ඇත. අධ්‍යයන සඳහා න්‍යායාත්මක පදනම ලෙස අධ්‍යාපන නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ පියවර සැලකිල්ලට ගන්නා ලද අතර, එහිදී ද නිෂ්පාදන යෙදවුම්, නිෂ්පාදන ක්‍රියාවලිය හා ඉගෙනුම් ඵල යන පියවර තුනම සැලකිල්ලට ගෙන ඇත.

අධ්‍යයනයයේ ප්‍රධාන තේමාව අනුව ද්විතියික අධ්‍යාපන ක්‍රියාවලිය මගින් සමාජ හැකියා සංවර්ධනය වන ආකාරය පිළිබඳව අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක ආකාරය අධ්‍යයනයට ලක් කිරීමෙන් සිදුකර ඇත. අධ්‍යාපන ක්‍රියාවලිය ලෙස විධිමත් විෂය මාලාව විෂය සමගාමී ක්‍රියා, සදාචාර විෂය මාලාව යන විෂය මාලා තුනම සැලකිල්ලට ගෙන ඇත.

විධිමත් විෂය මාලාවේ සමාජ දක්ෂතා සංවර්ධනය වන ආකාරය පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමේදී සමාජ දක්ෂතා සංවර්ධනයට සපයන දායකත්වය කෙබඳුදැයි අරමුණු අංක 01 යටතේ සොයා බැලීමෙන් තොරතුරු අනාවරණය කර ඇත.

විෂය සමගාමී ක්‍රියා මගින් සමාජ දක්ෂතා සංවර්ධනය වන ආකාරය අරමුණු අංක 02 යටතේ ද, සදාචාර විෂය මාලාවෙන් සමාජ දක්ෂතා සංවර්ධනය වන ආකාරය අරමුණු අංක 03 යටතේ ද සිදුකර ඇත. මේ හැර ඉගෙනුම් ඵලය ලෙස ශිෂ්‍ය සමාජ දක්ෂතා සංවර්ධනය වී ඇති ආකාරය අරමුණු 04 යටතේ අධ්‍යයනය කර ඇත. සමාජ හැකියා සංවර්ධනයේදී පද්ධතියේ නියුක්ත වුවන් මුහුණ දෙන දුෂ්කරතා, ගැටළු හඳුනාගැනීම ද අවසාන වශයෙන් සිදුකර ඇත. ඒ සඳහා පදනම් ලෙස අධ්‍යාපන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා කරනු ලබන යෙදවුම් කෙරෙහි බලපානු ලබන සාධක එකිනෙකෙහි ස්වභාවය පිළිබඳ තොරතුරු හෙළිදරව් කර ඇත.

අධ්‍යයනය සඳහා නියැදිය ලෙස ශ්‍රී ලංකාවේ විවිධ සමාජ ආර්ථික තල නියෝජනය වන දිස්ත්‍රික් තුනක් ලෙස කොළඹ, කෑගල්ල සහ අනුරාධපුර යන දිස්ත්‍රික් තුන යොදා ගෙන ඇති අතර, දිස්ත්‍රික්කයකින් පාසල් 05 බැගින් පාසල් 15 ක් අධ්‍යයනයට ලක් කර ඇත. සිසු නියැදිය ලෙස අදාළ පාසල් වලින් ඉගෙනුම ලබන සිසුන් එක් ශ්‍රේණියකින් සිසුන් 20 බැගින් සිසුන් 600 දෙනෙකු ද හා අදාල ශ්‍රේණි වල හර විෂය උගන්වන ගුරුවරුන් එක් පාසලකින් පස් දෙනෙකු බැගින් ගුරුවරුන් 75 දෙනෙකු අධ්‍යයනය සඳහා යොදාගෙන ඇත. සෑම පාසලකින්ම විදුහල්පතිවරයා ලෙස විදුහල්පතිවරු 15 දෙනෙකුගෙන් තොරතුරු ලබාගෙන ඇත. දත්ත රැස් කිරීමේදී විශේෂයෙන් විධිමත් විෂය මාලාවෙන් සමාජ දක්ෂතා සංවර්ධනය සිදුවන ආකාරය සොයා බැලීම සඳහා පන්ති කාමර 73 ක් නිරීක්ෂණය සිදුකර ඇත. විෂය සමගාමී ක්‍රියා ක්‍රියාත්මක වන ආකාරය පාසල් වල සදාචාර විෂය මාලාව ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම මූලිකවම නිරීක්ෂණයෙන් ලබාගත් දත්ත පදනම් කර සිදුකර ඇත. අවශේෂ දත්ත ලබාගැනීම සඳහා ගුරුවරුන්, සිසුන්, විදුහල්පතිවරුන් වෙත ලබාදුන් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ඇසුරින් සිදුකර ඇත. දත්ත රැස් කිරීමේදී හැකි සෑමවිටම හඳුනාගත් සමාජ හැකියා පදනම්කොටගෙන සිදුකර ඇත. දත්ත විශ්ලේෂණය ප්‍රතිශත වගු භාවිතයෙන් විස්තරාත්මකව හා අවශ්‍ය පරිදි ගුණාත්මක ක්‍රම ශිල්ප භාවිතයෙන් සිදු කර ඇත.

අධ්‍යයනයෙන් හෙළිවූ තොරතුරු අනුව පන්ති කාමර ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ශිෂ්‍ය සමාජ දක්ෂතා සංවර්ධනය ප්‍රමාණවත්ව සිදු නොවේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සමාජ දක්ෂතා සංවර්ධනය සඳහා ගුරුවරුන් සිසුන් යොමු කිරීම දුර්වල වන අතර, සිසුන්ගේ යොමු වීම එයටද වඩා දුර්වල වේ. විෂය සමගාමී ක්‍රියා මගින් සමාජ හැකියා සංවර්ධනය වන ආකාරය සතුටුදායක නොවේ. සමාජ දක්ෂතා සංවර්ධනයට උචිත පරිදි පාසල් වල සදාචාර විෂය මාලාව සැකසී නැත. සමාජ හැකියා සංවර්ධනය වී ඇති ආකාරය සැලකිල්ලට ගත් විට ධර්මතා හා ප්‍රතිමාන ගරුක බව හැර අනෙකුත් හැකියා සංවර්ධනය මැනවින් සිදුවී නැත. සමාජ හැකියා සංවර්ධනය වන සේ ද්විතියික අධ්‍යාපනය ක්‍රියාත්මක වීමට උචිත තත්ත්වයන් සැකසීම ප්‍රමාණවත්ව සිදුවී නැත.

# Summery

The objective of this study was to find out how secondary education contributes to improve/ develop the social skills/ capabilities of the students. Development of social abilities is a concept covering a wide subject scope as well as a long term process occurring with the influence of different factors. In the study, identifying the concept of social abilities is done in relation to the social learning theory of Windland and including the theories of social abilities presented by different educationists and scientists of later times. Empathy, building relationships, getting influences-influencing, communication, leadership, group collaboration and courtesy are such social abilities.

In the introduction of the study, how an uninterrupted development of social abilities took place in the children of the primary societies in relation to their social environment, later how the responsibility of social development was handed down to the school and at present, the efforts taken by the school education process directly to intervene in the development of social abilities in students are shown and the need to do so is proven.

In literature review, information revealing the different factors that affect the development of social abilities in students, how it is facilitated in schools at present and how it should be done are presented under the headings of formal curriculum, co curricular activities and curriculum in moral education. Further, details about steps taken by different countries related to development of students' social abilities are presented.

Under the study method, descriptive study method and mainly research method and qualitative research method were used as required. As the theoretical foundation of the study, different steps of education production process mainly production input, production process and production output were taken into consideration.

According to the main theme of the study, how social abilities develop by secondary education process was done by studying how education process is implemented. As education process, all three curricular, the formal curriculum, co curricular activities and moral education curriculum were considered.

Under objective no. 1, how social abilities are developed by formal curriculum is identified by researching about the contribution made by classroom teaching learning process for development of social abilities.

Under objective no. 2 , how social abilities are developed through co curricular activities and under objective number 3, how social abilities are developed through moral education were done. Besides, how social abilities are developed as a learning product is presented under objective number 4. Finally, the difficulties and issues faced by persons engaged in the system in developing social abilities are identified. As foundation for that, the nature of the factors affecting the inputs of education production process are revealed.

Representing different social and economic levels, three districts namely Colombo, Kegalle and Anuradhapura were selected as the sample for the study. Five schools from each district and a total of 15 schools were taken into study. As the student sample, 20 students from each grade of the relevant schools 600 students were studied. Five teachers teaching the main subjects of those grades in each school and 75 teachers in total were taken for the study. Information was obtained from 15 principals in total taking the principal of each school. In collecting data, to find out especially how curriculum helps in developing social abilities was observed by using 73 classrooms. How co curricular activities and moral education are implemented was basically observed by using data collected. Other data were obtained by giving questionnaires and conducting interviews with teachers, students and principals. Collecting data was always done based on identified social abilities. Analysis of data was done using percentage table descriptively and using quality methods as required.

According to the facts revealed from the study, an adequate development of social abilities is not done through classroom learning and teaching. Teachers directing students to develop social abilities in the learning teaching process is weak and students directing themselves to improve social abilities is also weaker than that. Developing social abilities by co curricular activities is not satisfactory. Moral education curriculum is not designed suitably to develop social skills. When considering about how social abilities were developed except and courtesy, other abilities were not properly developed. Conditions to implement secondary education to develop social abilities were not adequately done.